රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ (රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය) ("ව්‍යාපෘතිය") 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය සමඟ අත්සන් කරන ලද LK PFM ප්‍රදාන අංක TF0C1642 සහ 2023 ජුනි 30 දිනැති ප්‍රදානයේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම, අරමුණු, මූල්‍යනය සහ කාලපරිච්ඡේදය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කරන අතර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කරයි. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ආයතනමය ධාරිතාවය සහ ප්‍රසම්පදනයේ විනිවිදභාවය වැඩිදියුණු කිරීම වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 1,200 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 4 ක් වන අතර එය අන්තර්ජාතික සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කිරීමට එකග වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2023 ජුනි 07 දින ආරම්භ කළ අතර, 2026 නොවැම්බර් 30 දින අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. මූල්‍ය කාර්යසාධනය

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් රාජ්‍ය බැංකුවක ඇති පෙර ගෙවුම් කාඩ්පත් ගිණුමේ 2025 දෙසැම්බර් 31 දිනට පැවතුණු රු.58,250 ක ශේෂය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසෙහි 1.4 හා 1.5 යටතේ ඇති මාර්ගෝපදේශ අංක 09 ප්‍රකාරව, ආයතනයේ නිල බැංකු ගිණුමට මාරු කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි. | එහි සඳහන් කර තිබෙන නිරීක්ෂණය පිළිගනිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි අවශ්‍යතාවයන් වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 257 ට අනුව, සියළුම වවුචර් ගෙවීම සඳහා ගෙවීම් නිලධාරියාට ලබා දීමට පෙර නියමිත ලෙස සහතික කර තිබිය යුතු වුවත්, එකතු වටිනාකම රු.567,749 ක් වූ වවුචර් 06 ක සහතික කරන නිලධාරියාගේ අත්සන තබා නොතිබුණි. | එහි සඳහන් කර තිබෙන නිරීක්ෂණය පිළිගනිමි. | මුදල් රෙගුලාසි 257 ට අනුව සියළු ගෙවීම් වවුචර් නියමිත පරිදි සහතික කර ඇති බවට වග බලා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 262(2) ට අනුව, සියළු ගෙවන ලද වවුචර් සහ ඒවායේ උපකාරක ලියවිලි “ගෙවීම් කරන ලදී” යන මුද්‍රාව තබා තිබිය යුතු අතර, මුදල් පොතේ වාර්තා කර ඇති ගෙවීම් දිනය මුද්‍රාවේ සඳහන් කර තිබිය යුතුය. කෙසේනමුත්, 2025 ජනවාරි මාසයේ වවුචර් ගොනුව පරීක්ෂා කිරීමේදී වවුචර් අංක 250116 සහ 250103 හැර එකතු වටිනාකම රු.1,839,316 ක් වූ අනෙක් වවුචර් 18 ක අමුණා තිබූ උපකාරක ලිපි වල “ගෙවන ලදී” යන මුද්‍රාව තබා නොතිබුණි. | එහි සඳහන් කර තිබෙන නිරීක්ෂණය පිළිගනිමි. | මුදල් රෙගුලාසි 262(2) ට අනුව සියළු ගෙවන ලද වවුචර් සහ ඒවායේ උපකාරක ලියවිලි “ගෙවීම් කරන ලදී” යන මුද්‍රාව තබා ඇති බවට වග බලා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2.2 ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දේශීය අරමුදල් යටතේ රු.මිලියන 10 ක් සහ විදේශ අරමුදල් යටතේ රු.මිලියන 400 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබුණි. කෙසේනමුත්, දේශීය අරමුදල් සහ විදේශ අරමුදල් වලින් පිළිවෙලින් රු.162,000 ක් සහ රු.103,144,498 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී භාවිතා කර තිබුණි. ඒ හේතුවෙන්, දේශීය අරමුදල් යටතේ රු.9,838,000 ක් (සියයට 98 ක්) සහ විදේශ අරමුදල් යටතේ රු.296,855,502 ක් (සියයට 74 ක්) වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් වර්ෂය අවසානය වන විට පැවතුණු අතර, එමඟින් සැලකිය යුතු ඌණ උපයෝජනයක් නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ නිශ්චිත ප්‍රගති අදියර වන්නේ වැඩි දියුණු කරන ලද රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-GP) සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම වේ. කෙසේනමුත්, පෙර සිටි පද්ධති සංවර්ධකගේ (SIP) ප්‍රමාදයන් හේතුවෙන් සැලසුම් කළ ඉලක්ක සපුරා නොගැනීමෙන්, SIP ගේ ගිවිසුම අවසන් කරන ලදි. මුල් ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන් ඇති වීමෙන් ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට සහ අපේක්ෂිත අරමුණු සපුරා ගැනීමට, ව්‍යාපෘතියේ කාලසීමාව වර්ෂ දෙකකින් දීර්ඝ කිරීමට යෝජනා කර ඇත. ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම සම්බන්ධයෙන් යුරෝපා සංගමය, | ව්‍යාපෘතිය කාලීනව සම්පූර්ණ කිරීම සඳහා වෙන්කරන ලද මුදල් ඵලදායී ලෙස භාවිතා කර ඇති බවට සහතික වීමට කටයුතු කළ යුතුය. |

ලෝක බැංකුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙක් අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා සිදු කරමින් පවතී. අවශ්‍ය අනුමැතිය ලැබීමට යටත්ව, දීර්ඝ කරන ලද කාලසීමාව තුළ, වෙන් කරන ලද ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහ ඉතිරි ක්‍රියාකාරකම් නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව/ රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය (PFD/e-GP) අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

## 3. ව්‍යාපෘතියේ කටයුතු වල භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 නොවැම්බර් 25 දින රු.71,500,000 ක පිරිවැයකට e-GP පද්ධතිය සංවර්ධනය කිරීමට ඇපයෙන් සීමිත සමාගමක් (SIP) සමඟ මූලික ගිවිසුම අත්සන් කර තිබුණ ද, කොන්ත්‍රාත්කරු සතුටුදායක කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. මෙය නොසලකා, පද්ධතියට නව අනුවාදයක් සංවර්ධනය කිරීමට මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.152,870,000 දක්වා වැඩි කරමින් මාස 20 ක කාලසීමාවක් තුළ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා එම සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි.<br>තවද, පද්ධති සංවර්ධක ගිවිසුම්ගත බැඳීම් කිහිපයක් නොපිළිපැදීම, e-GP මොඩියුල් ලබා දීමේදී නිරන්තර ප්‍රමාද පැවතීම, ලිපි සඳහා ප්‍රතිචාර නොදැක්වීම සහ deliverables ලබා දීමට ඉල්ලීම් කළ ද ඒවා ලබා නොදීම ආදී | එහි සඳහන් කර තිබෙන නිරීක්ෂණය පිළිගනිමි. ව්‍යාපෘති සංවර්ධන අරමුණු (PDOs) සපුරා ගැනීමට සැලසුම් කර කටයුතු කාලීනව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට PFD/ e-GP සහතික කරනු ලබයි. මේ සම්බන්ධයෙන් PFD/ e-GP අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රතිඵල සපුරා ගැනීමට සහ ඉතිරි වී ඇති කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කර ඇති බවට වග බලා ගැනීම අරමුණු කර ගනිමින් උපායශීලී සැලසුමක් වැඩි දියුණු කිරීමට ලෝක බැංකුවෙන් විමසමින් විස්තරාත්මක තක්සේරුවක් සිදු කරමින් සිටියි. | එහි අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරුණු හේතුවෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව 2025 අගෝස්තු 29 දින පද්ධති සංවර්ධක සමඟ ගිවිසුම අවසන් කර තිබුණි. ඉන්පසු, 2026 වර්ෂයේදී නව පද්ධති සංවර්ධක සමාගමක් සමඟ ගිවිසුම්ගත වීමට මිල කැඳවීම් සිදු කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ අසතුටුදායක කාර්යසාධනය නොසලකා මුල් කොන්ත්‍රාත්කරු සමඟ අතිරේකයක් අත්සන් කිරීමට පෙර නව කොන්ත්‍රාත්කරුවෙක් තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ආ) | රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා නව පද්ධති සංවර්ධකයකු බඳවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2025 නොවැම්බර් 25 දින ආරම්භ කර 2026 ජුලි 08 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2026 අගෝස්තු 20 දින වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය මාස 01 ක් සහ දින 12 ක ප්‍රමාදයක් සහිතව සිදු වෙමින් පැවතුණි. | වර්තමානයේ යෝජනා සඳහා ඉල්ලීම් (RFP) සම්පූර්ණ කර ඇති අතර, මේ වන විට ප්‍රසම්පාදන යෝජනා ඇගයීමේ අවධියේ පවතී. 2026 අගෝස්තු අවසානයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර ගිවිසුම අත්සන් කිරීමට සැලසුම් කර ඇත. | හැකි විගස එහි අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ Version 3 තහවුරු කිරීම සඳහා තුන්වන පාර්ශවීය ස්වාධීන තහවුරුකරු වන පෞද්ගලික ආයතනයක් වෙත ඉදිරිපත් කර තිබූ අතර, Version 3 ක්‍රියාත්මක තත්ත්වයට සංවර්ධනය කර නොමැති බව එම ආයතනය විසින් දන්වා තිබුණි. ඒ සඳහා ගෙවීම් ලෙස එකතුව රු.4,398,538 ක් 2025 වර්ෂයේදී එම පෞද්ගලික ආයතනය වෙත ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීම සහ ඉතිරි ක්‍රියාකාරකම් සාර්ථකව නිම කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමේ අරමුණින් PFD/ e-GP විසින් ලෝක බැංකුව සමඟ සාකච්ඡා කරමින් පුළුල් ඇගයීමක් සිදු කරමින් පවතී. එහිදී පවතින කාර්යයන් හඳුනාගෙන, එම කාර්යයන් අභ්‍යන්තර කාර්යමණ්ඩලයක් හෝ බාහිර පාර්ශවයක් වෙත පැවරිය යුතුද යන්න තීරණය කරනු ලබයි. | එකඟ වූ පරිදි, පද්ධති සංවර්ධනයේ වැදගත් අවස්ථාවන් සපුරා ගෙන ඇති බව සහතික වීමට ව්‍යාපෘති අධීක්ෂණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය ශක්තිමත් කළ යුතුය. |
| (ඈ) | SLT Rainbow Pages විසින් 2026 ජුලි 31 දින වන විට සැපයුම්කරුවන් 1,350 දෙනෙකුගේ තොරතුරු e-GP Secretariat වෙත ලබා දී ඇති | SLT Rainbow Pages විසින් හඳුනාගන්නා ලද සැපයුම්කරුවන් බොහෝ දෙනෙක් භාණ්ඩ සැපයුම්කරුවන්ට වඩා සේවා | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් එම සියලු සැපයුම්කරුවන්ට e-GP පද්ධතිය පිළිබඳව දැනුවත් කිරීම් සිදු කර තිබුණ ද, එම සැපයුම්කරුවන් අතරින් 53 දෙනෙකු පමණක් e-GP පද්ධතියෙහි ලියාපදිංචි වී තිබුණි. පද්ධතියේ ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රතිචාර නොදැක්වීම ආදී ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් මෙම පද්ධතියේ ලියාපදිංචි රාජ්‍ය ආයතන 942 කින් 324 ක් පමණක් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හරහා තම ආයතනවල ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. | සපයන්නන් වේ. SLT Rainbow Pages විසින් සතිපතා සැපයුම්කරුවන් 250 ක් පිළිබඳ තොරතුරු සැපයීමට එකඟ වී තිබුණද, 100 කට අඩු සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු සපයන ලදී. හඳුනාගන්නා ලද සමහර සැපයුම්කරුවන් ඒ වන විටත් e-GP පද්ධතියේ ලියාපදිංචි වී තිබුණි. promise.lk පද්ධතියේ රාජ්‍ය ආයතන 942 ක් ලියාපදිංචි වී තිබුණ ද, ආයතන 324 ක් පමණක් e-GP පද්ධතිය හරහා සක්‍රියව ප්‍රසම්පාදන කටයුතු සිදු කරයි. | |
| (ඉ) | රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය පිළිබඳ උපදේශක ප්‍රතිපෝෂක සහ උපායමාර්ගික මගපෙන්වීම සඳහා වාර්තාව (Consultant Feedback & Request for Strategical Guidance on e-Gp System) හා 2025 ජූලි 16 දින පැවති Steering Committee Meeting – VI හිදී සාකච්ඡා කරන ලද World Bank Mission Report හි විශේෂිත කරුණු අනුව, පද්ධති සංවර්ධක ආයතනය විසින් පද්ධති සංවර්ධන නිලධාරීන් ප්‍රමාණවත් පරිදි e-GP පද්ධතිය සංවර්ධනය සඳහා යොදවා නොතිබුණි. එම තත්ත්වය නිවැරදි කර අනුමත මානව සම්පත් සැලැස්මට අනුව නිලධාරීන් පද්ධති සංවර්ධනය සඳහා යෙදවීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද, එම තත්ත්වය සතුටුදායක ලෙස නිවැරදි වී නොතිබුණි. | PFD/ e-GP විසින් SIP ගේ කාර්යසාධනය අධීක්ෂණය කරන අතර. ව්‍යාපෘති කාලසීමාව පුරාම ගිවිසුම්ගත අවශ්‍යතාවයන් අනුව සම්පත් යෙදවීම් සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත. | අනුමත මානව සම්පත් සැලැස්මට අනුකූලව අවශ්‍ය සුදුසුකම් සහිත කාර්යය මණ්ඩලය පද්ධති සංවර්ධක විසින් යොදවා ඇති බව සහතික කළ යුතු අතර, කිසියම් අනුකූල නොවීමක් සිදුවන්නේ නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ගිවිසුම්ගත විධිවිධාන දැඩිව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමෙහි සාමාන්‍ය ගිවිසුම් කොන්දේසිවල 3.8.1 හි Payments of Liquidated Damages වගන්තිය ප්‍රකාරව, | විගණන නිරීක්ෂණය පිළිගනිමි. | ගිවිසුම් ප්‍රතිපාදන අනුව අදාළ පරිදි ප්‍රමාද ගාස්තු පද්ධති සංවර්ධකගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳව සැලකිල්ලට ගත |

| | | | |
|---|---|---|---|
| | පද්ධති සංවර්ධකගේ ප්‍රමාද වීම් සඳහා දිනකට අදාළ Sprint/ Phase සඳහා ගෙවන මුදලින් සියයට 0.07142 ක අනුපාතයක් වන පරිදි ප්‍රමාද ගාස්තු අය කිරීම සිදු කළ යුතු බව සඳහන් කර තිබුණි. විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධන සැලැස්ම තුළ Sprint 01 හා 02 කාර්යයන් 2023 සැප්තැම්බර් 30 අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද, එය 2024 වර්ෂයේදී අවසන් කර තිබුණු අතර, එම ප්‍රමාදයන් සඳහා 2025 දෙසැම්බර් 31 දින වන විටත් පද්ධති සංවර්ධකගෙන් ප්‍රමාද ගාස්තු (Liquidated damages) අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | යුතුය. |
| (උ) | මිල සැඳහුම් ක්‍රමය යටතේ පමණක් විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා e-GP පද්ධතිය සංවර්ධනය කර ඇති බැවින්, දේශීය හා විදේශීය අරමුදලින් එකතුව රු. 204,808,125 ක වියදමක් ව්‍යාපෘතිය ආරම්භයේ සිට දරා තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂිත අරමුණ වූ රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල ආයතනික ධාරිතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | පෙර SIP ගේ අඛණ්ඩ ප්‍රමාදයන් හේතුවෙන් සැලසුම් කළ ප්‍රතිඵල ළඟාකර ගැනීමට නොහැකි විය. ඒ හේතුවෙන්, SIP සමඟ ගිවිසුම අවසන් කරන ලදී. පසුව, ඉතිරි e-GP මොඩියුල් සංවර්ධනය කිරීම සඳහා නව SIP බඳවා ගැනීමට PFD/ e-GP විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ අතර, PFD/ e-GP නව ගිවිසුම ක්‍රියාත්මක වීම අධීක්ෂණය කරන අතර, e-GP පද්ධතිය කාලීනව සංවර්ධනය කර යොදා ගැනීම සහතික කිරීමට කටයුතු කරනු ලැබේ. | විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ අනෙකුත් ප්‍රසම්පාදන ක්‍රමවල ප්‍රතිලාභ ඵලදායීව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | General Condition of Contract හි General Provisions හි 3.6 අනුව, පද්ධති සංවර්ධක විසින් e-GP පද්ධතියට අදාළව අත්සන් කරන ලද SRS Document, API Documentation, Manuals, Test Cases ආදිය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතු වුවද, මෙම ලිපිලේඛන භාරදීමේ ප්‍රමාදතාවන් හා ලිපිලේඛන ලබා නොදීම් පැවතුණි. එසේම, Appendix A.1 අනුව එක් එක් Sprint වලට අදාළව සකස් කරන ලද Software Requirements Specification (SRS) ලේඛන ලබා දිය යුතු වුවද, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත එම ලේඛන ලබා දී නොතිබීමෙන් තෙවන පාර්ශවය විසින් සිදු කරනු ලබන පරීක්ෂාවන් සිදු කිරීමට ද බාධාවක් වී තිබුණි. | මෙම කරුණ පෙර SIP ට අදාළ වන අතර, සිදු කරන ලද සියලු සංශෝධනයන් ඇතුළත් කරමින් යාවත්කාලීන කරන ලද SRS ලේඛන ඉදිරිපත් කරන ලෙස පෙර SIP වෙත ඉල්ලීම් කළ ද, යාවත්කාලීන කළ SRS ලබා දීමට පෙර SIP අපොහොසත් විය. මෙම දෝෂය ගිවිසුමෙහි කොන්දේසිවලට අනුකූල නොවීමක් ලෙස සලකන ලද අතර, ගිවිසුම අවසන් වීමට මෙය හේතුවක් විය. | පද්ධතිය සම්බන්ධ සියලු ලේඛන කාලීනව ඉදිරිපත් කිරීමට ගිවිසුම් ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (එ) | Version 2.1 SLT ආයතනයේ Server පහසුකම් මත ක්‍රියාත්මක වෙමින් පැවති අතර, එය නව Cloud පහසුකම වෙත ගෙන යෑමේ කටයුතු 2025 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. | පද්ධතියේ ස්ථායීතාව, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා, නිසි අධීක්ෂණ හා නිරීක්ෂණ ක්‍රමවේදයන් සහිතව ව්‍යුහගත පද්ධති සංක්‍රමණ සැලැස්මක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |